# රනිල් - පොහොට්ටු ආණ්ඩුවේ
## "අයවැය නම් වූ සුරංගනා කතාවේ"
# බේදාන්තය කුමක්ද?



ජනාධිපතිවරයා මුදල් ඇමතිවරයා ලෙස 2024 නොවැම්බර් 13 වැනිදා තම අයවැය කථාව ඉදිරිපත් කරමින් සඳහන් කළේ සුරංගනා කතා කියමින් රටක් ඉදිරියට ගෙන යා නොහැකි බවය. ඔහුගේ කතාවෙන් ගම්‍ය වූයේ තමා ද ඇතුළුව දේශපාලන නායකයින් විසින් ජනතාවට එවැනි කතා කියමින් ඉදිරිපත් කළ අයවැය නිසා රට බංකොලොත් වූ බවය. එහෙත් ඔහුගේ සමස්ත කතාව මගින් අර්බුදයට අදාළ තමාගේ දායකත්වය සඟවමින් සෙසු පාර්ශ්ව මත වගකීම පටවන ආකාරය දැක ගත හැක. ඒ මගින් ඔහු කවුරුන් ගොනාට ඇන්දවීමට උත්සාහ කළ ද සත්‍යය එතරම් පහසුවෙන් සැඟවිය හැකි ද? ඔහු අගමැතිවරයකු ලෙස අවස්ථා තුනක් ඇතුළත්ව වසර 44ක කාලයක් අමාත්‍ය මණ්ඩලය තුළ නියෝජනය වී ඇත. ඒ අතර ඔහුගේ කතාවේදී ඔහු සඳහන් කරන්නේ පීලි පැන තිබූ ආර්ථිකය නැවත පීල්ල මත තබන්නට තමාට හැකිවූ බවය. එතුමා කියන දුම්රිය මාර්ගයට ආර්ථිකය නම් වූ දුම්රිය හරවන්නේ 1977 මංසන්ධියේ දී බව එතුමාට මතක් කර දිය යුතුද?

එදා 1977දී විවෘත ආර්ථිකය ලෙස හැඳින්වූ නාගරික ඉදිකිරීම් සහ වෙළඳාම ප්‍රචලිත කිරීම මගින් ආර්ථික වර්ධනය අත්පත් කරගන්නා පරාධීන ආර්ථික මොඩලය හඳුන්වා දෙන්නේ එතුමාගේ මාමා විසින් එතුමා ද වාඩි වූ අමාත්‍ය මණ්ඩලය මගින් ගනු ලැබූ තීන්දු තීරණ අනුව බව රහසක් නොවේ. එනම් එතුමා සඳහන් කරන පිල්ලට දුම්රිය හරවන්නේ එතුමාගේ ද දායකත්වයෙනි. එම පීල්ල මත ගමන හෙවත් පරාධීන ආර්ථික මොඩලයක් තුළ ගමන අවසන් වන්නේ ආර්ථික ප්‍රපාතයකින් බව ආරම්භයේ සිටම පෙනෙන්නට තිබුණි. ඒ අනුව එතැන් සිට ආණ්ඩු කළ සියලු පක්ෂ සහ නායකයින් විසින් දුම්රිය කුමන වේගයෙන් ගියත් එය පැදවූයේ අපාය දෙසටම බව පිළිගැනීමට සිදුවේ.

ආර්ථික අපාය දක්වා ගමන් කරන එම මාර්ගයේ මග සලකුණු ප්‍රමාණයක් මෙසේ දැක්විය හැක. එදා 1977දී ශ්‍රී ලංකාවේ පළමු වරට වෙළඳ අතිරික්තයක් තිබුණි. ඊට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 1970 සිට ක්‍රියාත්මක වූ දේශීය නිෂ්පාදන පද්ධතිය ශක්තිමත් කෙරෙන ආර්ථික උපායමාර්ගික ප්‍රවේශය බව දත්ත පරීක්ෂා කිරීමේදී පෙනී යයි.  නමුත් 1977දී ආරම්භ කළ පරාධීන ආර්ථික මොඩලය තුළ දේශීය නිෂ්පාදන පද්ධතිය බිඳ වැටීම නිසා 1978 සිට නැවත වෙළෙඳ හිඟය වර්ධනය වීම ආරම්භ විය.

අද වන විට එම ගමන තුළ වෙළඳ හිඟය හෙවත්  ආනයන වියදම් සහ අපනයන ආදායම් අතර පරතරය ඩොලර් මිලියන 5000ක තරම් ඉහළ අගයක් දක්වා වර්ධනය වී ඇත.  කර්මාන්ත අමාත්‍ය ධුරය පවා හොබවමින් එතුමන්ලා විසින් හඳුන්වා දුන් ආර්ථික ප්‍රතිපත්ති මගින් වත්මන් මූල්‍ය අර්බුදයට අදාළ පළමු අර්බුදය හෙවත් ගෙවුම් ශේෂ අර්බුදය නිර්මාණය වූ බව සැඟවිය නොහැක. එසේ වෙළෙඳ හිඟය වර්ධනය වන විට ඇති වන ගෙවුම් ශේෂ හිඟය පියවීම සඳහා එතුමාගේ ආර්ථික මොඩලය තුළ දිගින් දිගටම ණය ගැනීමට සිදු වීම නිසා දෙවන අර්බුදය හෙවත් ණය අර්බුදය ඇති වූ බව ද ඉතා පැහැදිලිය. ජාවාරම්කාරයින්ට බදු වංචා කිරීමට ඉඩ සලසමින් වෙළඳාම ප්‍රචලිත කරන එතුමාගේ මොඩලය තුළ දේශීය නිෂ්පාදනය කඩාවැටීම නිසා රජයට ලැබිය යුතු ආදායම අහිමි වීම තුළ තුන්වන අර්බුදය හෙවත් රාජ්‍ය ආදායම් අර්බුදය නිර්මාණය වූ බව පරම සත්‍යයක් නොවේ ද?

කෙසේ වෙතත් ඉහත සඳහන් කළ තුන් වැදෑරුම් මූල්‍ය අර්බුදය නිර්මාණය කරමින් පැමිණි ගමන තුළ දක්නට ලැබුණු තවත් මඟ සලකුණු කිහිපයක් එතුමාට මතක් කර කර දීම වැදගත් වනු ඇත. එදා එතුමා බලයට පත්වන විට එනම් 1977දී රුපියල් 8.60ක් වූ ඩොලරයේ අගය 1994 දී එතුමා බලයෙන් පහ කෙරෙන විට රුපියල් 96ක් දක්වා වර්ධනය විය. එනම් රුපියලේ අගය 1000%කින් අවප්‍රමාණය විය. ඊට අමතරව 1977දී ඩොලර් මිලියන 750ක් වූ රාජ්‍ය ණය ප්‍රමාණය 1994 වන විට ඩොලර් මිලියන 10,000ක් දක්වා වර්ධනය විය. ඒ අනුව එතුමා කියන දුම්රිය මාර්ගයේ ගමනේ  තරම කෙසේදැයි තේරුම්ගත හැකි නොවේද?

ඉහත සඳහන් කළ ගෙවුම් ශේෂ අර්බුදය මගින් නිර්මාණය කළ ණය අර්බුදයට අදාළව ගත් විට නරකම ආදර්ශය ලබා දෙන්නේ 2015 -2019 වසරවල එතුමා අගමැතිවරයා ලෙස සිටියදී බව ද සැඟවිය නොහැක. ඒ මගින් ඒ වනවිට ඩොලර් මිලියන 3,000 මට්ටමේ තිබූ විදේශීය ස්වෛරී බැඳුම්කර ප්‍රමාණය දළ වශයෙන් ඩොලර් මිලියන 15,000 දක්වා වර්ධනය විය. එසේ වාණිජ ණය මිලියන 12,000ක් ලබාගන්නේ 6.8% සිට 7.2%

දක්වා වන ඉතා ඉහළ පොලියකට ය. එම පොලිය නීර්ණය කිරීමේදී විනිවිදභාවයක් නොතිබූ බවට හිටපු මහ බැංකු නියෝජ්‍ය අධිපතිවරයෙකු වූ පී. සමරසිංහ මහතා විසින් හේතු දක්වමින් හෙළිදරව් කරනු ලැබීය.

ඒ අනුව ප්‍රමාණාත්මකව ගත් විට දේශීයව බැඳුම්කර නිකුත් කිරීම මගින් සිදු කළ වංචාව හෙවත් කුප්‍රකට බැඳුම්කර වංචාව මගින් වංචා කළ මුදලට වඩා ස්වෛරී බැඳුම්කර වංචාව විශාල විය යුතු බව ඉතා පැහැදිලිය. ගෙවුම් ශේෂ අර්බුදය ණය අර්බුදයක් බවට පරිවර්තනය වන්නේ ඒ ආකාරයට ඉතා ඉහළ පොලියට වාණිජ ණය ගැනීම නිසා බවට කිසිදු විවාදයක් නැත. එහෙත් තම පාලන කාලයේදී ණය ගෙවා ගැනීමට නොහැකිව හිර වන්නේ ඊට පෙර පැවති යහපාලන ආණ්ඩුව විසින් කිසිදු සංවර්ධන ව්‍යාපෘතියක් නොමැතිව එදිනෙදා වියදම් පියවා ගැනීමට අධික පොලියට වාණිජ ණය ගැනීම නිසා බව හෙළිදරව් කිරීමට තරම්වත් අංක ගණිත දැනුමක් ජනාධිපති ගෝඨාභයට නොතිබූ බව පිළිගත හැකිද? සමහරවිට එතුමාට උපදෙස් දුන් ආර්ථික ඝාතක ලේකම්වරුන් වෙනත් හේතු දක්වමින් ඒවා යටපත් කළා විය හැක. එසේ නැතහොත් අර්බුදයට පිළියම් සෙවීමට පෙළඹවීම වෙනුවට එය වර්ධනය කිරීම එවැනි ප්‍රධාන උපදේශකයින්ගේ අරමුණ වූවා විය හැක.

කෙසේ වෙතත් ගෙවුම් ශේෂ අර්බුදයට මූල හේතුව වූ වෙළඳ හිඟය පියවා ගනු ලැබුවේ විදේශ ශ්‍රමිකයන්ගේ ජේ෴ෂණ සහ සංචාරක කර්මාන්තය මගින් ලැබුණු විනිමය ආදායම් මගිනි. නමුත් රනිල් වික්‍රමසිංහ මහතා විසින් 2017දී හඳුන්වා දුන් නව විදේශ විනිමය පනත මගින් විනිමය නීති ලිහිල් කරනු ලැබූ අතර අපරාධ වැරදි සිවිල් නඩු නිමිති බවට පත් කරනු ලැබීම නිසා ගෙවුම් ශේෂ අර්බුදය බරපතළ ලෙස වර්ධනය විය. ඊට හේතුව විනිමය කළු වෙළෙඳපොළ ප්‍රචලිත වීම සහ අපනයන ආදායම් රට තුළට ගෙනඒමෙන් තොරව විදේශ ගිණුම්වල තබා ගැනීමට හැකියාව ලැබීමය. ඊට අමතරව ඒ මගින් නීතිවිරෝධී විනිමය ජාවාරම්වලට ඉඩ සැලසීම නිසා රටින් පිටතට විනිමය ගලා යෑම ද වර්ධනය විය. ඒ අනුව වත්මන් ආර්ථික අර්බුදයට මූල හේතුවක් වන්නේ එම විදේශ විනිමය පනත බව ඉතා පැහැදිලිය. එහෙත් ජනාධිපතිවරයා විසින් ඊට අදාළව එක් වචනයක් හෝ අයවැය කතාවට ඇතුළත් කර නැත. එසේ නම් අර්බුදය පියමං කිරීම හෝ යහපත් ආර්ථික පරිසරයක් ගොඩනැගීම පිළිබඳ කතාව සුරංගනා කතාවක් නොවේද?

එසේ වුවත් තම අයවැය කථාව තුළ එතුමා තවදුරටත් සඳහන් කරන්නේ පැමිණි ගමනේ අඩුපාඩු හඳුනා ගනිමින් ඒවා නිවැරදි කිරීමට කටයුතු කරන බව ය. එසේම කෙටිකාලීනව නව පාලනය තුළ සාර්ථකත්වය අත් පත් කර ගනු ලැබුවේ ආර්ථික ප්‍රතිසංස්කරණ නිසා බව ද ඔහු සඳහන් කරයි. නමුත් අප රටේ සෑම පසුගිය අයවැයකම දක්නට ලැබුණ වියදම් නොකිරීම සඳහාම ඇතුළු කරනු ලබන ගණන් හිලව් බොහෝමයක් එතුමා විසින් ද ඉදිරිපත් කර ඇත. එහෙත් ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්කම් හෙවත් ආර්ථික උපායමාර්ගික රාමුවේ නව හැඩතල පිළිබඳ වචනයක හෝ සඳහනක් කර නැත. නමුත් නාමිකව එතුමා විසින් සඳහන් කරනු ලබන්නේ රටක අයවැය යනු හුදු අය සහ වැය තුලනය කිරීමේ ලේඛනයක් නොව ඒ මගින් ඉදිරි ආර්ථික උපායමාර්ගික රාමු ඉදිරිපත් කළ යුතු බවය. එතුමා විසින් අපනයන ආර්ථිකය වර්ධනය කළ යුතු බවටත් වෙළඳාම ප්‍රචලිත කළ යුතු බවටත් සංකල්පයක් ඉදිරිපත් කළ ද සැබෑ ලෙසින්ම සිදු කරනු ලබන්නේ ඊට සම්පූර්ණයෙන්ම පටහැනි ක්‍රියාවකි.

එනම් ආනයන අධෛර්යවත් කිරීම සඳහා සහ දේශීය නිෂ්පාදන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා පනවනු ලබන සෙස් බදු, විශේෂ පරිභෝජන බදු සහ වරාය ගුවන්තොටුපළ බදු ඉවත් කිරීමට අයවැය මගින් එතුමා යෝජනා කර ඇත. එමගින් එක් පැත්තකට පමණක් වෙළඳාම දිරිමත් වී ආනයනය වර්ධනය වන අතර දේශීය නිෂ්පාදන පද්ධතිය බිඳ වැටේ. එවිට අපනයන වර්ධනය කරන්නේ කෙසේද? අපනයන වර්ධනය කිරීම සඳහා පළමුව දේශීය වෙළෙඳපොළ ආරක්ෂා කර දීම මගින් දේශීය කර්මාන්ත පද්ධතිය ශක්තිමත් කළ යුතුය. නමුත් එතුමා විසින් ''තල වපුරා මුං" බලාපොරොත්තුවෙන් පුරාජේරු කතා පැවසීම හාස්‍යජනක නොවන්නේ ද? ජනාධිපතිවරයා විසින් තම කතාව තුළ සංඛ්‍යා හරඹ කරමින් සත්‍ය තේරුම් ගැනීම වැළැක්වීම සඳහා ද කටයුතු කර ඇත. එක් අවස්ථාවක ඔහු රාජ්‍ය වියදම්වලින් 35%ක් වැය වන්නේ රජයේ සේවකයින්ගේ වැටුප් ගෙවීමට බව කියමින් රාජ්‍ය සේවය කඩාබිඳ දැමීම සහ රාජ්‍ය ආයතන විකුණා දැමීම සාධාරණීකරණය කරයි. එහෙත් තවත් අවස්ථාවක ඔහුට නිලධාරීන් ලියා දුන් සංඛ්‍යාලේඛන එසේම කියවා දමයි. ඊට අනුව සෑම මාසයකම රාජ්‍ය අංශයේ වැටුප් ගෙවීමට රුපියල් බිලියන 93ක් වැය වන විට ණය පොලිය ගෙවීමට පමණක් මාසිකව රුපියල් බිලියන 200ක් වැය වන බව කියයි. ඒ මගින් ඔහු, තමා විසින් අධික පොලියට වාණිජ ණය ගැනීමේ විපාකය හෙළිදරව් කර ඇත.

අයවැය කථාව තුළ රාජ්‍ය බැංකු විසින් තම හිතවතුන්ට ඇප නොමැතිව ණය දීම මගින් රුපියල් මිලියන 300කට අධික ප්‍රමාණයක ණය කපාහැරීමට සිදු වීම නිසා බැංකුවලට සිදු වූ පාඩුව පිළිබඳව වචනයක්වත් සඳහන් වන්නේ නැත. එහෙත් ඛනිජ තෙල් සංස්ථාව සහ විදුලිබල මණ්ඩලය ණය වීම නිසා බැංකු කඩාවැටීම වළක්වා ගැනීම සඳහා රජයේ අරමුදල් යෙදවීමට සිදු වී ඇති බව පවසමින් අදාළ ආයතන පමණක් නොව

බැංකු ද පුද්ගලීකරණය කිරීමේ අවශ්‍යතාව ජනාධිපතිවරයා විසින් සාධාරණීකරණය කරයි. ඒ අනුව පළමු වසරේදී රාජ්‍ය බැංකු දෙකක කොටස්වලින් 20%ක් පුද්ගලික අංශයට බොහෝවිට විදේශීය බැංකුවලට විකුණා දැමීමට අයවැය මගින් යෝජනා කර ඇත. එම යෝජනා සියල්ල 2003 ''යළි පුබුදමු ශ්‍රී ලංකා වැඩසටහන" මගින් යෝජනා කළ ද ඒවා ඊට ඉටු කිරීමට නොහැකි වූ අතර එතුමාට එදා අගමැති පුටුවට ද අහිමි විය.

බැංකුවල කොටස් විකිණීම පිටුපස තවත් රහසක් ද ඇත. ඒ රාජ්‍ය වියදම් සඳහා බැංකු මගින් ණය ලබා ගැනීමය. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේදී රජය විසින් ලබාගත් ණය ගෙවා දැමීම පමා කිරීම සහ නව ණය ලබාගැනීම මගින් ඇති වන ප්‍රාග්ධන අර්බුදය, කොටස් විකිණීම මගින් විසඳිය යුතුය, යන්න සාධාරණීයකරණය කිරීමය. ඒ මගින් එතුමාගේ දීර්ඝකාලීන උවමනාවක් වූ රාජ්‍ය බැංකු පුද්ගලීකරණය කිරීම මෙන්ම ඉදිරි ජනාධිපතිවරණය ඉලක්ක කරමින් රාජ්‍ය බැකුවලින් ණය ලබාගෙන රාජ්‍ය සේවක වැටුප් වැඩි කිරීමට සහ අස්වැසුම ගෙවීම වැඩි කිරීමට අවස්ථාව නිර්මාණය වේ. එහිදී බැංකු කොටස් විකිණීම ආරම්භ කළ පසුව සහ ඊට එරෙහිව පවතින මහජන විරෝධය සමනය කර ගත් පසුව කොටස් ප්‍රමාණය 20% සිට 49% දක්වා හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකිණීමට ද පැහැදිලි ඉඩක් ඇත. එනම් රාජ්‍ය බැංකු සම්පූර්ණයෙන්ම පුද්ගලීකරණය කිරීමට පැහැදිලි ඉඩක් ඇත. ඊට අමතරව අයවැය මගින් ලබා ගන්නා අවස්ථාව යොදාගනිමින් මැතිවරණ ආසන්නයේදී අස්වැසුම අඩුපාඩු පූර්ණය කිරීමේ නාමයෙන් ''ඡන්ද ගුණ්ඩුවක්" ලෙස රාජ්‍ය බැකුවලින් ණය ලබාගෙන ගෙවීම් ප්‍රමාණය සහ පවුල් සංඛ්‍යාව වැඩි කිරීමේ හැකියාව ද ඇත.

ඉහත සඳහන් කළ ආකාරයට මෙම අයවැය සකස් කිරීමට තාක්ෂණික සහාය ලබා දුන් ඊනියා විද්වතුන් පී. බී. ජයසුන්දර මහතාගේ ආදර්ශය අනුව වියදම් නොකිරීම සඳහාම සහ සැරසිලි ලෙස සංඛ්‍යා රාශියක් ඇතුළත් කර ඇත. ඒවා වියදම් නොකළ ද ජනාධිපතිවරණය දක්වා සැරසිලි ලෙස භාවිතා කිරීමේ හැකියාව ඇත. මාර්ග ප්‍රතිසංස්කරණය, ප්‍රාග්ධන වියදම් සහ නව විශ්ව විශ්වවිද්‍යාල පිහිටුවීම සහ පවතින ඒවා වැඩි දියුණු කිරීම ආදිය සඳහා පෙන්වා ඇති සංඛ්‍යාවලින් 80%ක පමණ වියදම් නොකෙරෙන බව එම නිලධාරීහු ඉතා හොඳින් දනිති. එම බොරුව තුළ 'පට්ටි බොරුවක් ද දක්නට ඇත. උදාහරණයක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම් සඳහා රුපියල් මිලියන 500ක් වැය කරන බව සහ නව විශ්වවිද්‍යාල 4ක් පිහිටුවන බවට අයවැය කතාවේ සඳහන් වේ. නමුත් අයවැය ඇස්තමේන්තු කෙටුම්පත තුළ ඒ සඳහා මුදල් වෙන්කර නැත. එම සැරසිලිවල ඔතා විදේශීය විශ්වවිද්‍යාල යොදාගනිමින් විශ්වවිද්‍යාල අධ්‍යාපනය පුද්ගලීකරණය කිරීමේ ක්‍රියාවලිය සහ ඊට අවශ්‍ය ආකාරයට නීති සංශෝධනය කිරීම ද අයවැය යෝජනාවට ඇතුළත් කර ඇත. ඊට අමතරව විශ්වවිද්‍යාල අධ්‍යාපනය සහ වෘත්තීය අධ්‍යාපනය නියාමනය මධ්‍යම රජය මගින් සිදු කරන අතර වෘත්තීය අධ්‍යාපන ආයතන පද්ධතිය සහ වගකීම පළාත් සභාවලට පැවරීම මගින් බෙදුම්වාදීන් සතුටු කිරීම සඳහා ද අයවැය යෝජනා යොදාගැනීම ද විශේෂ තත්ත්වයකි.

කෙසේ වෙතත් විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ වැටුප් සහ දීමනාවලින් තුනෙන් එකක් බදු ලෙස කපා ගැනීම සඳහා අත්තනෝමතික බදු ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම නිසා විශ්වවිද්‍යාල ආචාර්යවරුන් රට හැර යන තත්ත්වයක් නිර්මාණය කිරීම මගින් පෞද්ගලික විශ්වවිද්‍යාල පිහිටුවීම පමණක් නොව රජයේ විශ්වවිද්‍යාලවලට විදේශ ආචාර්යවරුන් ගෙන්වීම ද සාධාරණීකරණය කෙරෙනු ඇත. මෙම ක්‍රියාවලියේ අවසාන ප්‍රතිඵලය වන්නේ රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය කුඩා කරමින් පුද්ගලික ආයතන පද්ධතිය පුළුල් කිරීම මගින් නිදහස් අධ්‍යාපන ක්‍රමයෙන් හකුළා දැමීම ය. ඉහත සඳහන් කළ ආකාරයට විශ්වවිද්‍යාල ඇදුරන් 5000කට අසාධාරණ බදු පනවා ආර්ථික අර්බුදය ජය ගැනීමට උත්සාහ කරන ආණ්ඩුව 2022 වසරේ මහ සමාගම්වලින් අයකර නොගෙන පිනට අතහැර ඇති බදු ප්‍රමාණය පමණක් රුපියල් මිලියන 950 ඉක්මවා යයි. එය රාජ්‍ය පිරිවැයවලින් අඩකි. ඊට අමතරව බිලියන 33ක වැට් බදු වංචා කර ඇත. එනම් මහජනයාගෙන් අයකරගෙන තිබෙන බදු රජයට නොගෙවා සිටිමින් යම් පුද්ගලික ආයතන කට්ටි පනිති. එහෙත් විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට බදු මගින් දඬුවම් කරන ආණ්ඩුව බදු හොරුන්ට නිදැල්ලේ සිටීමට ඉඩ දී ඇත. එහිදී ආණ්ඩුව ලබාදී ඇති නරකම ආදර්ශය වන්නේ රුපියල් මිලියන 52ක් දක්වා අගරු චෙක්පත් ලබා දුන් බදු වංචාකරුවන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක නොකිරීමය. ගමේ ණයකරුවෙකු මිලියනයක් සඳහා එසේ අගරු චෙක්පත් ලබා දුනහොත් ඔහුට හිරගෙදර ලැගීමට සිදු වේ. ආණ්ඩුවට හිතවත් සහ ආණ්ඩුවේ ඇමතිකම් දැරූ පුද්ගලයින් සුරා බදු නොගෙවා සිටීම මගින් රුපියල් බිලියන 450කට ආසන්න ප්‍රමාණයක් මහජනයාගෙන් අයකරගත් බදු රජයට නොගෙවා සිටියද ඔවුන්ට විරුද්ධව පියවර ගෙන නැත. එම බදු මුදල් ප්‍රමාණය එපමණ විශාල වුවද ඒ පිළිබඳ වචනයක්වත් අයවැය කතාවට ඇතුළත් වී නැත. එය අත්වැරදීමක් හෝ අමතකවීමක් විය නොහැකි බව ඉතා පැහැදිලිය.

මෙම අයවැය තුළ දක්නට ලැබෙන හාස්‍යජනකම ප්‍රවේශයක් වන්නේ ඉහත සඳහන් කළ ආකාරයට ආනයන දිරිමත් කෙරෙන බදු සහන ලබාදෙමින් සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවාට වෙළෙඳපොළ අහිමි කරන අතර ඔවුන්ට නව ණය දීම සඳහා රුපියල් බිලියන 30ක් වෙන් කිරීමය. මෙම වසර තුළ පමණක් එවැනි

කර්මාන්ත 2000ක් වැසී ගොස් ඇති අතර බැංකු විසින් ඔවුන්ගේ ණය ආපසු අයකර ගැනීම සඳහා උකසට තැබූ දේපළ වෙන්දේසි කිරීම ආරම්භ කර ඇත. දැනටමත් තම දේපළ උගසට තබා අධික පොලියට ණය ලබාගෙන අමාරුවේ වැටී සිටින කර්මාන්තකරුවන්ට මෙම නව ණය ලබා ගැනීමට හැකිවන්නේ නැත. බැංකු විසින් පැරණි ණය ප්‍රතිව්‍යුහගත කරන්නේද නැත. ජනාධිපතිවරයාගේ වචනවලට අනුව එය හුදු කිලිටි කොට්ට උරය පැත්ත මාරු කර භාවිතා කරන ලෙසට කරනු ලබන ඉල්ලීමකට සමාන වේ.

එසේම මෙම අයවැය යෝජනා මගින් ගොවියාට ඉඩම් අයිතිය ලබා දීමේ මුවාවෙන් සහ ඉඩම් අයිතිය නිරවුල් කිරීමේ මුවාවෙන් එම්.සී.සී. ගිවිසුමට අදාළ ඉඩම් වෙළඳපොළක් නිර්මාණය කිරීම හෙවත් අයිතිය ලබාදීම මගින් අයිතිය අහිමි කිරීමේ ක්‍රියාවලියට ද මුදල් වෙන් කර ඇත. මෙම අයවැය තුළ දක්නට ලැබෙන තවත් විශේෂ ලක්ෂණයක් වන්නේ මුදල් වෙන් කිරීමකින් තොරව හුදු අවශ්‍යතාව පමණක් සඳහන් කිරීම ය. උදාහරණයක් ලෙස කුඩා වැව් ප්‍රතිසංස්කරණය කළ යුතු බව සඳහන් වුව ද අදාළ ක්‍රමවේදය සහ මුදල් වෙන් කිරීම පිළිබඳව සඳහන් වන්නේ නැත. ඊට අමතරව යම් ක්ෂේත්‍ර සඳහා මුදල් වෙන් කළ ද ඒවා වැය කිරීමට අදාළ උපායමාර්ගික ප්‍රවේශය සඳහන් වන්නේ නැත. ඒ අනුව බොහෝ විට එම සංඛ්‍යා ඉහත සඳහන් කළ සැරසිලිවලටම අයත් විය හැක.

සමස්තයක් ලෙස ගත් විට මෙම අයවැය සුරංගනා කථාවක් වන්නේ මූලික වශයෙන් ඒ මගින් කියවෙන සුන්දර අරමුණු ඉටුකර ගැනීම සඳහා ආදායම් උපයා ගැනීමේ ගැටලුව නිසා ය. උදාහරණයක් ලෙස අය වැය ඇස්තමේන්තුව තුළ රජයේ සමස්ත ලැබීම් බිලියන 4164ක් සහ සමස්ත වියදම බිලියන 4358ක් ලෙස සටහන්ව ඇත. නමුත් 2022 වසරේ රාජ්‍ය ආදායම බිලියන 2012කි ඒ අනුව එම ප්‍රමාණය දෙගුණයකින් වැඩි කිරීම යතාර්ථයක්ද?. මීට අමතරව ණය සේවාකරණ ගෙවීම් බිලියන 6918ක් තිබෙන අතර මුළු ණය ගැනීමේ අවශ්‍යතාවය බිලියන 7350කි. අයවැය යෝජනා මගින් මෙම හිඩැස පියවීමට අදාලව නිශ්චිත යෝජනා ඉදිරිපත්වී නැත. එසේම අපනයනය වර්ධනය කළ යුතු බව සඳහන් වුවද  ඊට අදාළව උපායමාර්ගික ප්‍රවේශයක් පෙන්වන්නේ නැත. ඒ වෙනුවට ඉහත සඳහන් කළ ආකාරයට අපනයන ආර්ථිකය  තවදුරටත් කඩාවැටෙන ලෙස, දේශීය කර්මාන්ත පද්ධතිය බිඳවැටෙන ආකාරයට ජාවාරම්කාර ආනයනකරුවන්ට බදු සහන ලබාදේ. ශ්‍රී ලංකාවේ දේශීය කර්මාන්තකරුවන්ගේ ප්‍රධානතම සංවිධානය වන CNCI සංවිධානය පවසන්නේ තම සංවිධානය විසින් රජයට ලබාදුන් යෝජනා 18ක් අතුරින් 1ක් හෝ අයවැය යෝජනා අතර දක්නට නොලැබෙන බවය. මෙම අයවැය තුළ ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒම සඳහා කිසිදු උපායමාර්ගික යෝජනාවක් අඩංගු නොවන බව සාමාන්‍ය දැනුම ඇති  ඕනෑම අයෙකුට තේරුම් ගත හැක. එසේ වුවත් පැරැණි පාරේම, පැරණි ආකාරයට ගමන් කිරීම හෙවත් අර්බුදයෙන් පෙරළුණු දුම්රිය පීල්ල මත තැබීමෙන් පමණක් අර්බුදයෙන් ගොඩඒමට නොහැකි බව මහජනයාට තේරුම් ගැනීමට නොහැකි වනු ඇතැයි ජනාධිපතිවරයා කල්පනා කරන බව පෙනේ. එහෙත් මෙම අයවැය මගින් තෝරා ඇති මාර්ගයේ හෙවත් පැරණි මාර්ගයේම ගමන් කිරීම මගින් පරාධීන ආර්ථික මොඩලය වෙනස් නොවන බව සහ  අර්බුදයෙන් ගොඩඒමට නොහැකි බව මහජනයා තේරුම් ගනු ඇත.

කෙසේ වෙතත් ඉදිරි ජනාධිපතිවරණයට පෙර එවැනි තේරුම් ගැනීමක් සිදු නොවනු ඇතැයි ජනාධිපතිවරයා විසින් කල්පනා කරන බව පෙනේ. එසේ නොමැතිනම් ජනාධිපතිවරණයක් අභියස ඉතා පැහැදිලිව ඛේදාන්තයකින් අවසන් වන සුරංගනා කතාවක් අයවැය නමින් ඉදිරිපත් කිරීමට දෙවරක් සිතා බැලීමට ඔහු පෙළඹෙනු ඇත. එහෙත් ඔහුට උපායමාර්ග තෝරා දෙන පැරණි නිලධාරී රොත්තට වසර 44ක් කළ දේ හෙවත් ඔවුන් දන්නා දේ හැර වෙනත් දෙයක් කළ නොහැකි බව ඉතා පැහැදිලිය. සමහර විට බංග්ලාදේශයේ උපදේශකයින් ගෙන්වාගතහොත් සහ ජනාධිපතිවරයාට තමා ඉතිහාසයේ කළ වැරදි නිවැරදි කිරීමට අවංක උවමනාවක් තිබුණානම් තත්වය වෙනස් වීමට ඉඩ තිබුණි. ඒ අනුව මෙම අයවැය මගින් ජනාධිපතිවරයා බලාපොරොත්තු වන්නේ ආර්ථික අර්බුදය තවදුරටත් උත්සන්න වීමට ඉඩ හැර ශ්‍රී ලංකාවේ ආර්ථිකය ඉන්දියාවේ ආර්ථිකය සමග ඒකාබද්ධ කිරීම හැර වෙනත් විකල්පයක් නෙමැති බවට මහජනයාට එත්තුගැන්වීම විය හැක. එනම් 1974දී සිකීමයේ අගමැති ලෙන්ඩබ් ජෝජස් සිදු කළ ආකාරයට ශ්‍රී ලංකාව ඉන්දියාවේ 29 වැනි ප්‍රාන්තය බවට පත්කර ආණ්ඩුකාර ධුරය බාරගැනීමට ජනාධිපතිවරයා අපේක්ෂා කරනවා විය හැක.

# දේශහිතෛෂී ජාතික ව්‍යාපාරය

2024-11-25